# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2053/3 - 2018 ජනවාරි මස 08 වැනි සඳුදා - 2018.01.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* කේඩීඑස්/ජීඅයිකේ/4/1/3/19.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:* 4-3/15/2013/වීඊ/95.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මල්වත්තගම ග්‍රාම නිලධාරී වසමේ පැල්ලපිටිය ගමේ පිහිටි සර්වෙයර් ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද මහ 6639 හා 2017.05.18 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 සිට 03 ලෙස පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 10.1171 ක් පමණ වන කුරුඳුවත්ත වත්ත නමැති ඉඩම.

01. කැබලි අංක 01
ඉඩමේ නම: කුරුඳුවත්ත; විස්තරය: -; හිමිකම් කියන අය: රොබට් ඩබ්. හාලි; ප්‍රමාණය: හෙක්. 9.8685.

02. කැබලි අංක 02
ඉඩමේ නම: කුරුඳුවත්ත; විස්තරය: -; හිමිකම් කියන අය: රොබට් ඩබ්. හාලි; ප්‍රමාණය: හෙක්. 0.1107.

03. කැබලි අංක 03
ඉඩමේ නම: කුරුඳුවත්ත; විස්තරය: -; හිමිකම් කියන අය: රොබට් ඩබ්. හාලි; ප්‍රමාණය: හෙක්. 0.1379.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2018.02.21 වැනි දින ප.ව. 2.00ට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018.02.15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

කේ. ජී. ලැනරෝල්,
ප්‍රාදේශීය ලේකම්,
ගඟ ඉහළ කෝරළේ.

2018 ජනවාරි මස 03 වැනි දින,
ගඟඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-593